# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2366/21 – 2024 ජනවාරි මස 11 වැනි බ්‍රහස්පතින්දා – 2024.01.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 277/40

(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත

33 වැනි වගන්තිය යටතේ වූ නියමය

(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ 33 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්, කේ. ඒ. ඩී. ආර්. නිශාන්ති ජයසිංහ වන මා විසින්, ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අනුමතය සහිතව, මේ නිවේදනය මගින්, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති රජයේ ඉඩම් කොටස එකී ආඥාපනතේ කාර්යය සඳහා ''පුරාවිද්‍යාත්මක කටයුතු සඳහා වෙන් කළ භූමියක්'' ලෙස සළකනු ලැබිය යුතු බවට ප්‍රකාශයට පත් කරනු ලැබේ.

කේ. ඒ. ඩී. ආර්. නිශාන්ති ජයසිංහ,
පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්.

2024 ජනවාරි මස 08 වැනි දින,
කොළඹ දී ය.


1A – G041223 – 07 (2024/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

### පුරාවිද්‍යාත්මක කටයුතු සඳහා වෙන්කළ කිරළාගල භූමි ප්‍රදේශය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, හොරොව්පතාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 119 ඉහළ අගුනොච්චිය ග්‍රාම නිලධාරි වසමේ අගුනොච්චිය ගම පිහිටි මිල්ලගහහේන හෙවත් නුගගහවත්ත නමැති ඉඩමට සර්වේයර් ජනරාල් විසින් මැන සාදන ලද අවසාන ගම් පිඹුර අංක 1373, 1382 සහ 1387 පිඹුරුවල සඳහන් ඉඩම් කොටස්වලින් බෙදා වෙන්කර සාදන ලද අනුරේඛන අංක Aa/DSO/2020/359 හා 2020.12.15 දින දරන පිඹුර ප්‍රකාරව කැබලි අංක A දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර පනස් දෙකයි දශම හතයි නවයයි අටයි නවයකින් (හෙක්ටයාර 52.7989) වටවූ ප්‍රදේශය පහත පරිදි -

1. අ. ග. පි. 1373 අනුව
   කැබලි අංක 1, 2, 3, 4, 5, 6, 7, 8, 11, 12, 15, 16, 17, 18 වෙනි කැබලි 9, 10, 14 සහ 13 වෙනි කැබලිවල කොටස් සහ 5, 9 වෙනි කැබලිවල කොටස්වලින්

2. අ. ග. පි. 1382 අනුව
   කැබලි අංක 7, 8 සහ කැබලි අංක 5, 9 වෙනි කැබලිවල කොටස්වලින්

3. අ. ග. පි. 1387 අනුව
   කැබලි අංක 46, 81, 83, 84, 85, 87, 88, 89, 90, 91 කැබලි 43, 77, 78, 79, 80, 82, 86, 135 වෙනි කැබලිවල කොටස්වලින් සමන්විත වේ.

EOG 01 – 0088

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.